සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

22.02.2024

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

De Mazenod College Kandana

**වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)**
**ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)**
**Year End Evaluation - 2023 (2024)**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 2 යි |

නම / பெயர் / Name ....................................... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .......................

- I කොටසේ ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- I කොටසේ අංක 1 සිට 20 දක්වා ඇති ප්‍රශ්න සියල්ලේම නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.

## I - කොටස

01. "මෙම දිවයිනේ වැස්සෙන් ලැබෙන ජලය මඳකුත් ලෝකෝපකාරයෙන් තොරව මුහුදට නොයේවා" මෙම ආදර්ශ පාඨයට අනුව කටයුතු කළ රජතුමා කවුරුන්ද?
   1. වසභ රජතුමා 2. මහසෙන් රජතුමා
   3. ධාතුසේන රජතුමා 4. පළමුවන පරාක්‍රමබාහු රජතුමා

02. ස්වභාවික සුළං බලය යොදාගෙන අතීතයේ යකඩ නිස්සාරණය කළ බවට තොරතුරු හමු වූ ප්‍රදේශය වන්නේ,
   1. දෙහි ගහ ඇළ කන්ද ප්‍රදේශය යි. 2. සමනළ වැව ප්‍රදේශය යි.
   3. අම්පාර රජගල ප්‍රදේශය යි. 4. මහනුවර ප්‍රදේශය යි.

03. පොළොන්නරුවේ සඳකඩ පහනින් වෘෂභ රූපය ඉවත් වන්නේ කුමන ආගමික බලපෑමක් නිසා ද?
   1. ජෛන 2. ඉස්ලාම් 3. හින්දු 4. බෞද්ධ

04. නව පෝරණුවක් සකස් කර ප්‍රමිතියෙන් යුතු ගඩොල් නිෂ්පාදනය කර, ප්‍රතිසංස්කරණය කරන ලද දාගැබ මින් කුමක් ද?
   1. ජේතවන දාගැබ 2. අභයගිරි දාගැබ 3. ථූපාරාම දාගැබ 4. රුවන්මැලි දාගැබ

05. පළමුවන රාජසිංහ රජු උඩරට ආක්‍රමණය කරන විට දී මන්නාරමට පලා ගොස් පෘතුගීසීන්ගේ රැකවරණය පැතූ රජතුමා වූයේ,
   1. දොන් ජුවන් ධර්මපාල ය. 2. පළමුවන විමලධර්මසූරිය ය.
   3. කරලියැද්දේ බණ්ඩාර ය. 4. ජයවීර බණ්ඩාර ය.

06. ලන්දේසීන්ගෙන් සහාය ලබාගෙන පෘතුගීසීන් ලංකාවෙන් නෙරපා දමූ රජතුමා කවුරුන් ද?
   1. දෙවන රාජසිංහ රජු ය. 2. සෙනරත් රජු ය.
   3. පළමුවන රාජසිංහ රජු ය. 4. කීර්ති ශ්‍රී රාජසිංහ රජු ය.

07. මහනුවර රාජධානිය ආශ්‍රිතව පැවති වී ගොවිතැන පිළිබඳව නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   1. වැව් ජලය මගින් ගොවිතැන් කටයුතු සිදු විය.
   2. හෙල්මලු ක්‍රමයට වී වගා කෙරුණි.
   3. වී ගොවිතැන සිදු නොවුණ අතර ගෙවතු වගාව සිදු විය.
   4. වී ගොවිතැන සිදු වූයේ හේන්වල පමණි.

08. මහනුවර රාජධානි සමයේ යකඩ කර්මාන්තය සඳහා ප්‍රසිද්ධියක් ඉසිලූ ප්‍රදේශය වන්නේ,
   1. දුම්බර ය. 2. වලපනේ ය. 3. කොත්මලේ ය. 4. හුන්නස්ගිරිය ය.

09. පුනරුද සමයේ කලා ශිල්පවල දක්නට ලැබුණු සුවිශේෂී ලක්ෂණයක් වන්නේ,
   1. ආගමික මුහුණුවරක් ගැනීම ය. 2. විවිධ ධනවතුන් අනුග්‍රහ දැක්වීම ය.
   3. ස්වාධීන නිර්මාණ කිරීමට ඉඩක් නොවීම ය. 4. ශිල්පීන් ශ්‍රේණි වශයෙන් සංවිධානය වීම ය.

10. මහාචාර්ය මාටිං ලූතර් කතෝලික සභාවෙන් නෙරපා දැමීමට හේතු වූ ප්‍රධාන කරුණ මින් කුමක් ද?
   1. විටෙන්බර්ග් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ධූරයක් දැරීම ය.
   2. පව් සමාකිරීමේ පත්‍ර විකිණීමට විරුද්ධව අදහස් ඉදිරිපත් කිරීම ය.
   3. බයිබලය ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම ය.
   4. ජෝන් කැල්වින් වැනි නායකයින් සමඟ ආගමික ප්‍රතිසංස්කරණ කටයුතු වල නියැලීම ය.

11. යුරෝපයේ පුනරුදය ආරම්භ වූ රට කුමක් ද?
   1. ඉතාලිය   2. රෝමය   3. ග්‍රීසිය   4. ප්‍රංශය


12. පෘථිවිය පැතලි වස්තුවක් යන මතය නිෂ්ප්‍රභා වූයේ, මින් කුමන විද්‍යාඥයාගේ සොයා ගැනීම නිසා ද?
   1. ජොහැන්නස් කෙප්ලර්   2. ගැලීලියෝ ගැලිලි
   3. නිකලස් කොපර්නිකස්   4. අයිසැක් නිව්ටන්

13. පෘතුගීසීන්ගේ පෙරදිග පාලන මධ්‍යස්ථානය පිහිටි ප්‍රදේශය හැඳින්වූයේ කුමන නමින් ද?
   1. බතාවිය   2. කල්කටා   3. පොන්ඩිචේරි   4. ගෝව

14. පෘතුගීසීන් මෙරටට පැමිණෙන අවධියේ යාපනය පාලනය කළ රජතුමා වූයේ,
   1. පරරාජසේකරම් ය.   2. සංකිලි ය.   3. කුලසේකර ය.   4. වරෝදය ය.

15. පෘතුගීසීන් විසින් කනකපුල්ලේ, ලියන්නන්, මයෝරාලවරුන් වැනි සුළු නිලධාරීන් පත්කර තිබුණේ පහත කවර කාර්යයන් සඳහා ද?
   1. ලේඛන කටයුතු සඳහා ය.   2. වෙළඳ ද්‍රව්‍ය පිටරට යැවීම සඳහා ය.
   3. නීති සකස් කිරීම සඳහා ය.   4. ආදායම් එකතු කිරීම සඳහා ය.

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු ලිවීමට දී ඇති ලෝක සිතියම උපයෝගී කරගන්න.




16. කොන්ස්තන්තිනෝපල් නගරය දැක්වෙන අක්ෂරය
   1. A   2. B   3. C   4. D

17. අරාබිය දැක්වෙන අක්ෂරය
   1. C   2. D   3. E   4. F

18. රෝමය දැක්වෙන අක්ෂරය
   1. A   2. B   3. C   4. D

19. ඉන්දියාව දැක්වෙන අක්ෂරය
   1. A   2. B   3. C   4. F

20. පිලිපීන දූපත් දැක්වෙන අක්ෂරය
   1. B   2. C   3. E   4. F   (ලකුණු 2 × 20=40)


## II - කොටස

- පළමුවන ප්‍රශ්නය අනිවාර්යය වේ.
- අනෙකුත් ප්‍රශ්න අතුරින් කැමති ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

---

1. පහත A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

A



(අ) (i) මෙම පැරණි ගොඩනැගිල්ල කුමක් ද?
(ii) එය ඉදි කරන ලදැයි සැලකෙන රජතුමා කවුරුන් ද?
(iii) මෙම ගොඩනැගිල්ල අයත් වන්නේ කුමන රාජධානි සමයට ද?
(iv) වංශකතා අනුව මෙම ගොඩනැගිල්ලේ පැවති මහල් ගණන කීය ද?

(ලකුණු 2 × 4 = 8)

B



(ආ) (i) B පින්තූරයේ දැක්වෙන පුද්ගලයාගේ නම ලියන්න.
(ii) මොහු කුමන ජාතිකයෙක් ද?
(iii) මොහු කෝට්ටේ පාලකයින් සමග ඇති කරගත් ගිවිසුමේ නම ලියන්න.
(iv) එම ගිවිසුම අත්සන් කළේ කුමන වර්ෂයේදී ද?

(ලකුණු 2 × 4 = 8)

2. (i) පහත සඳහන් මහ වැව් ඉදිකළ රජවරුන්ගේ නම් ලියා දක්වන්න.
(a) මහවිලච්චිය වැව
(b) මින්නේරිය වැව (ල. 2)
(ii) වැවක දැකිය හැකි ප්‍රධාන අංග හතරක් ලියන්න. (ල. 4)
(iii) විශාල ප්‍රමාණයේ වැව් තැනවීමේදී ලාංකිකයන් මුහුණදුන් අභියෝග දෙකක් සඳහන් කර, ඉන් එකක් විස්තර කරන්න. (ල. 5)

3. (i) දුටුගැමුණු රජු විසින් ඉදි කරවන ලද දාගැබ් දෙකක් නම් කරන්න. (ල. 2)
(ii) ආගමික නොවන ගොඩනැගිලි වර්ග 4 ක් නම් කරන්න. (ල. 4)
(iii) පිළිම ගෙවල් නිර්මාණය කළ ප්‍රධාන සම්ප්‍රදායන් තුන නම් කර, ඉන් එක් සම්ප්‍රදායක් පිළිබඳව පැහැදිලි කරන්න. (ල. 5)

4. (i) මහනුවර රාජධානියට ආරක්ෂාව ලැබෙන ප්‍රධාන ගංගාව හා කඳුවැටියක් නම් කරන්න. (ල. 2)

(ii) මහනුවර රාජධානියේ රාජ්‍යත්වයට පත් පහත සඳහන් රජවරුන් රජවීමට පෙර භාවිත කළ නම ලියා දක්වන්න.

(A) II වන රාජසිංහ රජු

(B) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු (ල. 4)

(iii) මහනුවර යුගයේ චිත්‍ර කලාවේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් විස්තර කරන්න. (ල. 5)

5. (i) මධ්‍යතන යුගයේ අවසානයේ යුරෝපයේ බිහි වූ විශ්වවිද්‍යාල දෙකක් නම් කරන්න. (ල. 2)

(ii) පුනරුද සමයේ පහත සඳහන් නිර්මාණ බිහි කළ පුද්ගලයින් A, B, C, D අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A) මොනාලිසා චිත්‍රය

B) දුරේක්ෂය

C) මුද්‍රණ යන්ත්‍රය

D) පියෙටා රුව (ල. 4)

(iii) යුරෝපයේ පුනරුදය ඇතිවීමට බලපෑ හේතු දෙකක් ලියා ඉන් එකක් පැහැදිලි කරන්න. (ල. 5)

6. (i) දේශ ගවේෂණ ව්‍යාපාරවලට සම්බන්ධ වූ යුරෝපා රටවල් දෙකක් නම් කරන්න. (ල. 2)

(ii) දේශගවේෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් පහත සඳහන් ස්ථාන සොයාගත් දේශගවේෂකයින් නම් කරන්න.

A) මෙක්සිකෝව

B) ඇමරිකාව

C) ඉන්දියාව

D) කුණාටුතුඩුව (ල. 4)

(iii) දේශගවේෂණ ව්‍යාපාර ඇතිවීමට බලපෑ හේතු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)

7. (i) විජයබා කොල්ලයෙන් පසුව කෝට්ටේ රාජ්‍ය බෙදී ගිය රාජධානි දෙකක් නම් කරන්න. (ල. 2)

(ii) සීතාවක රාජධානියේ දියුණුවට බලපෑ හේතු දෙකක් ලියන්න. (ල. 4)

(iii) පෘතුගීසීන්ගේ උඩරට ආක්‍රමණ අසාර්ථකවීමට හේතු වූ කරුණු දෙකක් ලියා ඉන් එකක් විස්තර කරන්න. (ල. 5)